දුරකථන / தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊ මේල් / ஈ-மெயில் / E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
බත්තරමුල්ල.
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை,
பத்தரமுல்ல
"Isurupaya", SriJayawardhanapuraKotte
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව


මගේ අංකය / எனது இல. / My No. } ED/01/12/02/06/02

දිනය / திகதி / Date } 2014.05. 16.

## චක්‍රලේඛ අංක : 16/2014

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත,

**<u>ද්විතීයික විෂයමාලා ප්‍රතිසංස්කරණය - 2015 සිට</u>**

දැනුමැති සමාජය තුළ දැනුම ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර, ගෝලීයකරණය තුළින් එම වෙනස්කම් අප රට තුළ ද එසැනින්ම ව්‍යාප්ත වෙමින් පවතී. එම වෙනස්කම් මතු පරපුරට ලබා දිය යුතු බැවින් පාසල් විෂයමාලාව ද කාලීන අවශ්‍යතා අනුව වෙනස් විය යුතුව ඇත. සෑම වසර 8කට වරක් පාසල් විෂයමාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව පිළිගෙන ඇති හෙයින් 2007 වසරේ දී ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දුන් පාසල් විෂයමාලාව ප්‍රතිසංස්කරණය කිරීමට කාලය එළඹ ඇත. එබැවින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ නිර්දේශ මත 2015 වර්ෂයේ සිට ද්විතීයික ශ්‍රේණි (6 -11) විෂයමාලා ප්‍රතිසංස්කරණය හඳුන්වා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

ඒ අනුව, 2006.03.07 දිනැති අංක 2006/09 දරණ චක්‍රලේඛය ට හා, 2007.03.07 දිනැති අංක 2007/06, 2008.04.21 දිනැති අංක 2008/12 සහ 2008.09.15 දිනැති අංක 2008/12 (i) දරණ චක්‍රලේඛ සංශෝධනයන්ට අමතර ව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

මෙම චක්‍රලේඛය මගින් ද්විතීයික ශ්‍රේණිවල විෂයයන් හා කාලච්ඡේද සංඛ්‍යාවේ වෙනසක් සිදු නොවන අතර, විෂය අන්තර්ගතය පමණක් ප්‍රතිසංස්කරණය වනු ඇත.

2015 වර්ෂයේ 6 හා 10 ශ්‍රේණි සඳහා ද, 2016 වර්ෂයේ 7 හා 11 ශ්‍රේණි සඳහා ද, 2017 වර්ෂයේ 8 ශ්‍රේණිය සඳහා ද, 2018 වර්ෂයේ 9 ශ්‍රේණිය සඳහා ද මෙම ප්‍රතිසංස්කරණ විෂයමාලාව ක්‍රියාත්මක කරනු ලැබේ. තව ද, පැරණි විෂයමාලාව 2015 වර්ෂයේ දී 7,8,9 හා 11 ශ්‍රේණි සඳහා ද, 2016 වර්ෂයේ දී 8 හා 9 ශ්‍රේණි සඳහා ද, 2017 වර්ෂයේ දී 9 වන ශ්‍රේණිය සඳහා ද බල පැවැත්වේ. එය පහත සඳහන් වගුව මගින් ද ඉදිරිපත් කෙරේ.

| වර්ෂය / ශ්‍රේණිය | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|
| 2015 | NS | OS | OS | OS | NS | OS |
| 2016 | NS | NS | OS | OS | NS | NS |
| 2017 | NS | NS | NS | OS | NS | NS |
| 2018 | NS | NS | NS | NS | NS | NS |

NS – New Syllabus - (නව විෂය නිර්දේශය)

OS – Old Syllabus - (පැරණි විෂය නිර්දේශය)

මෙම ප්‍රතිසංස්කරණය කරන ලද විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ දී පාසල් කාල සටහන් පෙර පැවති අයුරින් ම සැකසිය යුතු අතර, 2015 වර්ෂයේ සිට පාසල තුළ ක්‍රියාත්මක කරන මෙම ප්‍රතිසංස්කරණය කරන ලද විෂයමාලාව හදාරනු ලබන සිසුන් ප්‍රථම වතාවට 2016 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිනු ඇත. අදාළ ප්‍රතිසංස්කරණයන් ට අනුව කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස අවධාරණය කරමි.

ප්‍රාථමික ශ්‍රේණිවල විෂයමාලා ප්‍රතිසංස්කරණ 2016 වර්ෂයේ සිට ආරම්භ කිරීමට තීරණය කර ඇත.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
02. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - කරු. අ.ක.ස.
04. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස.
05. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස.